num = ………….. (input("Enter the number to be multiplied : "))
for i in range (…………. , …………..):
    print(………………….)
```



(7) WWW.PastPapers.WiKi (6)
Download Term Test Papers, Short Notes From One Place!

(c) පහත පයිතන් ක්‍රමලේඛයේ ප්‍රතිදානය ලියා දක්වන්න.

```
def fib(n):
    a,b = 0,1
    while a<n:
        print(a,end = ' ')
        a,b = b,a+b
fib(5)
```

.......................................................................................................................

.......................................................................................................................

(d) "ABC.txt" නමින් ඇති පාඨ ගොනුවක අන්තර්ගතය "I am learning " වේ.

(i) පහත පයිතන් කේතයේ ප්‍රතිදානය කුමක් ද ?

```
f=open('ABC.txt','a')
f.write(" Python")
f=open('ABC.txt','r')
y=f.read()
print(y)
f.close
```

.......................................................................................................................

.......................................................................................................................

(ii) ප්‍රතිදානය ලෙස "Python" පමණක් ලබාගැනීමට ඉහත (i) හි සඳහන් කේතයේ වෙනස් කළ යුතු කේත පේළිය එම වෙනස්කම ද සමග ලියන්න.

.......................................................................................................................

.......................................................................................................................

PAST PAPERS WIKI



Download Term Test Papers, Short Notes From One Place!

## B – කොටස

5. (a) $\bar{A}BC + A\bar{B}C + AB\bar{C}$ යන සම්මත SOP තාර්කික ප්‍රකාශනය, POS තාර්කික ප්‍රකාශනය බවට පරිවර්තනය කරන්න.

(b) පහත දැක්වෙන්නේ එක්තරා තාර්කික පරිපථයක් සම්බන්ධ විස්තරයකි.

මෙම පරිපථය ආදාන සංඥා 03 ක් ලබා ගනී. ඒවා පිළිවෙළින් A, B, C ලෙස නම් කෙරේ. එම ආදාන සියල්ල XOR ද්වාරයක් හරහා සැකසී පළමු ප්‍රතිදානය (P) ලබා ගනී. එම ප්‍රතිදානය නැවත B ආදානය සමග OR ද්වාරයක් හරහා සැකසී දෙවන ප්‍රතිදානයක් (Q) ලබා ගනී. දෙවන ප්‍රතිදානය නැවත C ආදානය සමග AND ද්වාරයක් හරහා සැකසී අවසාන ප්‍රතිදානය (R) ලබා ගනී.

(i) මෙම විස්තරයේ දැක්වෙන ක්‍රියාවලිය නිරූපනය කෙරෙන තාර්කික පරිපථ සටහන ගොඩනගන්න.
(ii) එම පරිපථ සටහන සඳහා ආදාන හා ප්‍රතිදාන සම්බන්ධතා නිරූපණය කෙරෙන සත්‍යතා වගුවක් ගොඩනගන්න.
(iii) පරිපථයේ ප්‍රතිදානය සඳහා SOP ආකාරයේ බූලීය ප්‍රකාශනයක් සත්‍යතා වගුව මගින් ලබා ගන්න.
(iv) කානෝ සිතියමක් භාවිතයෙන් ඉහත $(iii)$ හි ලබාගත් බූලීය ප්‍රකාශනය සුළු කර දක්වන්න.
(v) සුළු කර ලබා ගත් බූලීය ප්‍රකාශනය සඳහා සුදුසු සාර්ව ද්වාරයක් යොදාගෙන තාර්කික පරිපථ සටහන ගොඩනගන්න.

6. (a) විවෘත පද්ධති අන්තර් සම්බන්ධතා ආකෘතිය (OSI) සම්බන්ධව පහත දී ඇති ඡේදයේ ❶ සිට ❻ දක්වා අංක ලේබල කර ඇති හිස් තැන්වලට ආදේශ කළ හැකි වඩාත් සුදුසු පද ලියා දක්වන්න.

විවෘත පද්ධති අන්තර් සම්බන්ධතා ආකෘතිය (OSI) යටතේ පරිගණක අතර දත්ත සම්ප්‍රේෂණ ක්‍රියාවලිය ස්ථර ..........❶........ තුල සිදුවන අතර එක් නෝඩුවක (node) සිට තවත් නෝඩුවක් අතර බිටු සම්ප්‍රේෂණය ..........❷.......... ස්ථරය මගින් සිදුකරනු ලබයි . එසේම එක් නෝඩුවක සිට තවත් නෝඩුවකට දත්ත මාරු කිරීමේ දී දෝෂ රහිත බව සහතික කිරීම හා තාර්කික සබැඳි පාලනය (Logical Link Control) මෙන්ම මාධ්‍ය ප්‍රවේශ පාලනය (Media Access Control) ..........❸......... ස්ථරය තුළ සිදුකරනු ලබයි. දත්ත යවනු ලබන නෝඩුව මගින් ඉහළ ස්ථරයෙන් ලබා ගන්නා දත්ත ඛණ්ඩනය සිදුකර ප්‍රවාහ සහ දෝෂ පාලනයන් ක්‍රියාත්මක කිරීම් සිදුකිරීම ..........❹.......... ස්ථරයේ වගකීමකි. ..........❺.......... ස්ථරය මගින් සමමුහුර්තකරණය සහ සංවාද පාලනය කරනු ලබන අතර විවිධ කේත ක්‍රම අතර දත්ත පරිවර්තනයන් සිදුකිරීම.............❻............... ස්ථරයේ කාර්යයකි.

(b) ආයතනයක දෙපාර්තමේන්තු හතරක් සම්බන්ධ කරමින් පරිගණක ජාලයක් නිර්මාණය කිරීමට අවශ්‍යව ඇත. එම දෙපාර්තමේන්තු නම්, විකුණුම් හා මිලදී ගැනීමේ දෙපාර්තමේන්තුව, සංවර්ධන දෙපාර්තමේන්තුව, ගිණුම් දෙපාර්තමේන්තුව සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව වේ. ආයතනයේ ජාල පරිපාලක වෙත 192.200.1.0/25 ලිපින කාණ්ඩය ලබා දී ඇති අතර, ඒ ඒ දෙපාර්තමේන්තු සඳහා $IP$ ලිපින වෙන් කළ යුතුව ඇත.

සංවර්ධන දෙපාර්තමේන්තුවට ඇති පරිගණක ප්‍රමාණයට අමතරව නියෝජන සේවාදායකයක් $(proxy\ server)$ එක් කොට එම ජාලය හරහා ආයතනයේ අනෙකුත් ජාලවලට අන්තර්ජාල සම්බන්ධතාවය ලබා දීමට ජාල පරිපාලක තීරණය කර ඇත.

ඉහත IP ලිපින කාණ්ඩය පහත අවශ්‍යතා සම්පූර්ණ කරන ලෙස උපජාලනය කිරීම අවශ්‍ය වේ. එක් එක් දෙපාර්තමේන්තුව වෙන් වෙන් ගොඩනැගිලිවල ස්ථාපනය කර ඇති බව සලකන්න.

| උපජාල අංකය (subnet Number) | දෙපාර්තමේන්තුවේ නම (Department Name) | පරිගණක සංඛ්‍යාව (Number of Computers) | සේවාදායක (servers) |
|---|---|---|---|
| D001 | විකුණුම් හා මිලදී ගැනීම් | 15 | - |
| D002 | සංවර්ධන | 30 | නියෝජන සේවාදායකය |
| D003 | ගිණුම් | 12 | - |
| D004 | කළමනාකරණ | 14 | - |

(i) දී ඇති IP ලිපින කාණ්ඩයෙහි පළමු යොමුව හා අවසාන යොමුව ලියන්න.

(ii) දී ඇති IP ලිපින කාණ්ඩයේ උපජාල ආවරණය(subnet mask) තිත් දශමක අංකනයෙන් (dotted decimal notation) ලියා දක්වන්න.

(iii) දී ඇති උපජාල නිර්මාණය කිරිමට අවශ්‍ය සත්කාරක බිටු ගණන කොපමණද?

(iv) උපජාලනයෙන් අනතුරුව පහත දක්වා ඇති වගුව පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න.

| උපජාල අංකය (subnet Number) | ජාල යොමුව (Network Address) | උපජාල ආවරණය (Subnet mask) | භාවිතා කළ හැකි පළමු යොමුව (First host address) | භාවිතා කළ හැකි අවසාන යොමුව (Last host address) | විකාශන ලිපිනය (Broadcast address) |
|---|---|---|---|---|---|
| D001 | ..................... | ..................... | ..................... | ..................... | 192.200.1.95 |
| D002 | 192.200.1.0 | ..................... | ..................... | ..................... | ..................... |
| D003 | ..................... | ..................... | 192.200.1.97 | ..................... | ..................... |
| D004 | ..................... | ..................... | ..................... | ..................... | ..................... |

(c) (i) සමමිතික යතුරු කේතනය ( Symmetric Key Encryption) සහ අසමමිතික යතුරු කේතනය (Asymmetric Key Encryption) අතර ඇති වෙනස්කමක් ලියන්න.

(ii) පරිගණක ජාලයකට හානිකර මෘදුකාංග මගින් ඇති විය හැකි තර්ජන දෙකක් ලියා දක්වන්න.

(d) (i) නියෝජන සේවාදායකයක ( Proxy server) කාර්යයන් දෙකක් ලියා දක්වන්න.

(ii) වසම් නාම පද්ධති(DNS) සේවාදායකයක කාර්යය කුමක්ද?

7. (a) නිවැසියන් නොමැති නිවසක රාත්‍රිය උදාවනවිට විදුලි පහන් ස්වයංක්‍රීයව දැල්වීමටත් උදේ කාලයේ හිරු එළිය ලැබෙන විට විදුලි පහන් නිවා දැමීමටත් සැලසුම් කර ඇති IoT ඇටවුමක වියුක්ත සැලැස්මක් (Abstract design) පහත රූපයෙන් දක්වා ඇත.




විදුලි පහන් සහිත ආලෝක පද්ධතිය ක්‍රියාත්මක කරන ස්විචය පාලනය කිරීමට ජංගම යෙදුමක්(mobile application) ද යොදා ගනී. රූපයේ දක්වා ඇති පරිදි ඇටවුම සංවේදකයකින්(Sensor) – S, ධාරා පාලක මොඩියුලයකින්(Current Controller) – C, සන්නිවේදන මොඩියුලයක් සහිත ක්ෂුද්‍ර පාලකයකින්(Arduino Board) – A යන කොටස් වලින් යුක්තය.

(i) රූපයේ අදාළ ස්ථානවලට (①, ②,③) ඉහත සන්දර්භයේ විස්තර කර ඇති සංරචකවල අක්ෂර(A, C, S) ගලපන්න.

(ii) M ඊතලය එක් දිශාවකට පමණක් යොමු කර ඇත්තේ ඇයිදැයි පහදන්න.

(iii) ඉහත ඇටවුම තුල පවතින සංවේදකය මගින් පරිසරයේ පවතින සූර්යාලෝක තත්වයේ තීව්‍රතාවය අනාවරණය කර ගැනීමට අදහස් කරයි. මෙම හඳුනාගැනීම සඳහා යෝග්‍යම සංවේදකයේ නම ලියා දක්වන්න.

(b) ඇටවුමේ සවිකර ඇති S සංවේදකය මගින් ආලෝක තීව්‍රතාවයේ මට්ටම(ප්‍රතිසම ආදානයක් -Analog Input) දශමය අගයක් ලෙස ක්ෂුද්‍ර පාලකය තුල දී භාවිත කරන බව සලකන්න. එම ආලෝක තීව්‍රතාවයේ මට්ටම 0 සිට 63 දක්වා අගයන්හි පවතින විට එය අඳුරු අවස්ථාවක් ලෙස හඳුනාගෙන විදුලි පහන් දැල්වීමටත්, ආලෝක තීව්‍රතාවයේ මට්ටම 64 සිට 1023 දක්වා පරාසයේ පවතින විට එය හිරු උදා වී ඇති අවස්ථාවක් බව හඳුනාගෙන විදුලි පහන් නිවා දැමීමටත් ගොඩනගන ලද ඇල්ගොරිතමයක් දකුණුපසින් පෙන්වා ඇත. එහි X, Y, P, Q සහ R ලෙස ලේබල කර ඇති ස්ථාන සඳහා සුදුසු ප්‍රකාශ ලියා දක්වන්න.

```
While(true){
        ආලෝක තීව්‍රතාවයේ මට්ටම O_L  ලෙස ආදානය කරන්න
        If [X and Y]
                If  ධාරා පාලකය ක්‍රියාත්මකව ඇත
                        Then  ධාරා පාලකය  අක්‍රිය කරන්න
                End if
        Else
                If [P and Q]
                        If ]R[
                                Then  ධාරා පාලකය  ක්‍රියාත්මක කරන්න
                End if
        End if
}
```

[සටහන: While(true) කාණ්ඩය ආඩියුනෝ හි නොනැවතී ධාවනය වන ලූපය (loop) දක්වයි.]

(c) නිවස සහිත භූමියට හෝ ඒ ආසන්නයට යම් සත්වයෙකු ගේ (විශේෂයෙන් මිනිසෙකු ගේ) ඇතුළුවීමක් අනාවරණය කර ගැනීම සඳහා තවත් සංවේදකයක් මෙම පද්ධතිය හා සම්බන්ධ කිරීමට අදහස් කරයි. ඒ සඳහා වඩාත් සුදුසු ම සංවේදකය වරහන් තුල දී ඇති පද අතරින් තෝරා ලියන්න.

{LDR, IR, Motion- PIR, Touch(ස්පර්ශ)}

(d) ප්‍රයෝජන කිහිපයක් සලකා මෙම නිවස සඳහා බහුඒජන්ත පද්ධතියක් (පහත රූපය) යෝජිතය. පරිශීලකයෙකු හට එම පද්ධතිය සමඟ තම ජංගම දුරකථනය මගින් සම්බන්ධ විය හැකිය. එම පද්ධතියේ දී, නිවසේ සවිකර ඇති කැමරා (Video Camera) කිහිපයක් මගින් ලබා ගන්නා ආදානයන්හි මනුෂ්‍ය හැසිරීමක් අනාවරණය වී ඇත්නම් එම අවස්ථාවන්හි ඡායාරූප “නිරීක්ෂණ” නම් දත්ත සමුදායේ ගබඩා කෙරේ. බහු ඒජන්ත පද්ධතිය පහත පරිදි ක්‍රියාකරයි.



- ඒජන්ත1 කැමරා මගින් ලැබෙන වීඩියෝ (video) පරීක්ෂා කොට මිනිස් චලනයක් යැයි සැක සහිත රූප පමණක් "නිරීක්ෂණ" දත්ත සමුදායට යැවීම හා ඒ බව ඒජන්ත3 ට දැනුම් දීම.

- ඒජන්ත2 ලේසර් කිරණ මගින් අනාවරණය කර ගන්නා මනුෂ්‍ය චලනයක් පිළිබඳ තොරතුරු (වේලාව හා ස්ථානය ආදී) "නිරීක්ෂණ" දත්ත සමුදාය වෙත යැවීම සහ ඒ බව ඒජන්ත3 ට දැනුම් දීම.

- ඒජන්ත3 "නිරීක්ෂණ" දත්ත සමුදායට අලුතෙන් එක් වී ඇති ඡායාරූප හා අනෙකුත් තොරතුරු "නිර්ණායක" දත්ත සමුදායෙහි නිර්ණායක සමඟ සසඳා බලයි. තව ද පවතින නිර්ණායක සමඟ සැසඳෙනු නොලබන තොරතුරු පවතීනම් එම තොරතුරු පරීක්ෂා කිරීමට සෙවුම් ඒජන්තවරයෙකු අමතයි.

- සෙවුම් ඒජන්ත අදාළ තොරතුරු සඳහා අන්තර්ජාලය ද පිරික්සයි. ප්‍රථිඵල ඒජන්ත3 ට ලබා දුන් පසු, ඒජන්ත3 විසින් අනතුරු ඇඟවීමක් අවශ්‍ය නම් පරිශීලක දැනුවත් කිරීමත්, නව තොරතුරු මගින් "නිර්ණායක" දත්ත සමුදාය යාවත්කාලීන කිරීමත් සිදුකරයි.

(i) දෙන ලද සංදර්භයේ ස්වීය-ස්වයංකරණ(self-autonomous) ඒජන්තවරයා/ ඒජන්තවරු කවු ද?

(ii) මෙවැනි බහු ඒජන්ත පද්ධතියක් මගින් අපේක්ෂිත වාසි දෙකක් ලියා දක්වන්න

(iii) ඒජන්ත 3 විසින් නව තොරතුරු සෙවීම සඳහා සෙවුම් ඒජන්ත ඇමතීම මගින් ඇතිවිය හැකි අවාසිදායක තත්වයක් කෙටියෙන් පහදන්න.

(e) එම ප්‍රදේශයේ පියැවූ පරිපථ කැමරා(CCTV) පද්ධති සහිත වෙනත් නිවාස අයිතිකරුවන් හටත් ඉහත විස්තර කර ඇති ඒජන්ත පද්ධතිය මගින් සහය ලබා ගැනීමට අවස්ථාව ලබා දීමට මෙම පද්ධතියේ අයිතිකරුවන් අදහස් කරයි.

(i) මාසිකව හෝ වාර්ෂිකව ගෙවීමක් සිදුකොට පද්ධතියට ප්‍රවේශ වීමට සහ සේවා ලබාගැනීමට අවස්ථාව ලබා දීමට අදහස් කරයි නම් අපේක්ෂිත විද්‍යුත් වාණිජ්‍යය ආදායම් ප්‍රවර්ගය(business revenue model) කුමක් ද?

(ii) මෙම පද්ධතිය අවට ප්‍රජාවටත් භාවිත කිරීමට අවස්ථාව ලබා දීම මගින් මෙම පද්ධතියේ අයිතිකරුවන්ට ලද හැකි වාසියක් සහ ඉන් සිදුවිය හැකි අවාසියක් ලියා දක්වන්න.

(iii) පවතින පද්ධතියේ දත්තවල ආරක්ෂාව සම්බන්ධයෙන් ඇතිවිය හැකි අවාසිදායක තත්ව මගහැරවීම සඳහා නව ඒජන්තවරෙකු භාවිතය මගින් ගතහැකි ක්‍රියාමාර්ගයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

8. පහත සඳහන් පයිතන් ක්‍රමලේඛයේ ආදානය ලෙස සෑම විටම ආදානය ලෙස ලබා දෙනු ලබන්නේ ඉලක්කම් 2ට වඩා වැඩි සංඛ්‍යාවක් බව සලකන්න.

(a) (i) ආදානය ලෙස 205 ලබා දුන් විට පහත දැක්වෙන පයිතන් කේතයේ ප්‍රතිදානය කුමක් වේ ද ?

```
print("Enter a Number: ")
num = int(input( ))

count = 0
while num!=0:
    if count = = 0:
        A = num%10
        count = count+1
    B = num%10
    num = int(num/10)

output = A + B
print("output is  ", output)
```

## B – කොටස

(ii) දෙන ලද ධන සංඛ්‍යාවක පළමු ඉලක්කම හා අවසාන ඉලක්කම ප්‍රතිදානය කර ගැනීමට, ඉහත පයිතන් කේතයේ output = A + B පේළිය කෙසේ වෙනස් විය යුතු ද ?
(උදා ඃ ආදානය 1234 වූ විට ප්‍රතිදානය 14 විය යුතු ය)
**(සැ.යු. වෙනස් කළ, අදාල පේළිය පමණක් ලිවීම ප්‍රමාණවත් වේ.)**

(b) ඕලු හා නෙළුම් ලෙස නිවාස දෙකක් ඇති පාසලක, ශිෂ්‍ය ඇතුලත්වීමේ අංකය ඉරට්ටේ සංඛ්‍යාවක් නම් ඕලු නිවාසයටද ඔත්තේ සංඛ්‍යාවක් නම් නෙළුම් නිවාසයට ද ලෙස සිසුන් ඇතුලත් කරයි.
සෑම ඇතුලත්වීමේ අංකයක්ම STU අකුරුවලින් ආරම්භ වෙයි. (උදා : STU200, STU201 යනාදි ලෙස)

සිසුවකුගේ ඇතුලත්වීමේ අංකය ආදානය කළ විට, නිවාසය ප්‍රතිදානය කිරීමට පයිතන් ක්‍රමලේඛයක් ගොඩනගන්න.

**සැ.යු.**
**සෑම ආදානයකදීම STU අකුරු සමග සම්පූර්ණ ඇතුලත්වීමේ අංකය ආදානය කරන බවත්, ඉන් පසු ක්‍රමලේඛය මගින් STU නොසලකා හැර ඒ සමග ඇති සංඛ්‍යාව පමණක් නිවාසය සෙවීමට, ගණනය කිරීම් සඳහා යොදාගන්නා බවත් උපකල්පනය කරන්න.**
උදාහරණයක් ලෙස STU200 ආදානය කළ විට, ඕලු නිවාසය ලෙස ප්‍රතිදානය විය යුතු වේ.

(c) ආදානය කරන ලද සංඛ්‍යා දහයක එකතුව ප්‍රතිදානය කිරීමට සකසන ලද ගැලීම් සටහනක් මෙහි දක්වා ඇත. එහි A සිට G දක්වා ඇති ලේබල සඳහා වඩාත් ගැලපෙන ප්‍රකාශන ලියා දක්වන්න. මෙම ගැලීම් සටහනේ එක් ක්‍රියාවලි කොටුවක (process box) ප්‍රකාශන එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ තිබිය හැක.



9. (a) කිසියම් වෙළඳසැලක භාණ්ඩ සැපයුම්කරුවන් හා ඔවුන් සපයනු ලබන භාණ්ඩ අතර ඇති සම්බන්ධතාවය නිරූපණය කරන පහත දැක්වෙන සම්බන්ධක පටිපාටිය සලකන්න. Item හා Supplier සම්බන්ධකයන්හි අනන්‍ය උපලක්ෂණ පිළිවෙලින් itemNo සහ supId වේ.

Item (<u>itemNo</u>, itemName, price)
Supplier (<u>supId</u>, supName, address)
Item_suplier (<u>itemNo</u>, <u>supId</u>, quantity)
Supplier_phone (<u>supId</u>, <u>phoneNo</u>)

ඉහත සම්බන්ධක පරිපාටි සියල්ල නිවැරදි භූතාර්ථ සම්බන්ධතා සටහනකට අනුරූපණය කරන්න.

(b) පහත දැක්වෙන දත්ත සමුදාය වගුව සලකන්න.

Student_mark

| St_id | Subject_code | Marks | Subject_name |
|---|---|---|---|
| S78452 | ICT20 | 84 | Information technology |
| S78569 | ICT20 | 90 | Information technology |
| S78452 | ET85 | 75 | Engineering technology |
| S78424 | BST86 | 66 | Bio Systems Technology |

ඉහත වගුවේ St_id + Subject_code භාවිත කර දත්ත අනන්‍යව හඳුනාගනු ලබයි.

(i) ඉහත වගුව පවතින ප්‍රමතකරණ මට්ටම කුමක් ද? ඒ සඳහා හේතු, වගුව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.
(ii) ඉහත වගුව ඊළඟ ප්‍රමතකරණ මට්ටම දක්වා ප්‍රමතකරණය කරන්න. (දත්ත ලිවීම අනවශ්‍යයයි)
(iii) SQL භාවිත කර ඉහත වගු, දත්ත සමුදාය තුළ නිර්මාණය කළේ යැයි උපකල්පනය කරමින් පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A - එකිනෙකට වෙනස් විෂය නාම(Subject_name) ප්‍රදර්ශනය කිරීම සඳහා SQL ප්‍රකාශය ලියා දක්වන්න.

B - 'formation' යනුවෙන් කොටසක් අන්තර්ගත විෂය නාම පවතීනම් ඒ සියල්ල ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසු SQL ප්‍රකාශය ලියා දක්වන්න.

C - පහත SQL ප්‍රකාශයේ ප්‍රතිදානය ලියා දක්වන්න.
SELECT * FROM Student_mark LIMIT 2 ORDER BY Marks;

10. *Pizza planet* නම් වූ ආයතනය තුළ සිදුවන ක්‍රියාකාරකම් පහත විස්තර කර ඇත.

*Pizza planet* නම් වෙළඳසලෙහි දුරකථනය හරහා හෝ වෙළඳසලට පැමිණ හෝ පාරිභෝගිකයින් හට පීසා ඇණවුම් කළ හැකි අතර ඇණවුම ලබාගැනීමට පාරිභෝගිකයින් වෙළඳසල වෙත පැමිණිය යුතු වේ. පීසා ඇණවුම් කිරීමට නම් එම වෙළඳසලෙහි ලියාපදිංචි වූ පාරිභෝගිකයින් හට දුරකථන අංකය ආයතනයේ දුරකථන ක්‍රියාකරු වෙත ලබා දිය යුතු අතර නව පාරිභෝගිකයෙකු නම් නම, ලිපිනය හා දුරකථන අංකය ලබා දී ලියාපදිංචි විය යුතුය.

ඉන් පසු එම පාරිභෝගිකයින් කෑම වට්ටෝරුව ඉල්ලූ විට දුරකථන ක්‍රියාකරු විසින් වට්ටෝරු ගොනුව මගින් වට්ටෝරු තොරතුරු ගෙන ඔවුන්ගේ දුරකථනය වෙත ලබා දෙයි. පාරිභෝගික තොරතුරු, දත්ත පාදකයක ඇති අතර දුරකථන අංකය ලබා දුන් විට ලියාපදිංචි වී සිටින පාරිභෝගිකයින්ගේ තොරතුරු ලබා ගත හැකි වේ. නව පාරිභෝගිකයින්ගේ තොරතුරු එහි තැන්පත් වේ.

පීසා ඇණවුම දුරකථන ක්‍රියාකරු වෙත ලැබුණු පසුව ඇණවුම ගබඩා කරන අතර ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (හැදි, ගෑරුප්පු, ඇසුරුම් පෙට්ටි වැනි දෑ) පිළිබඳ ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කරනු ලබයි. එම ඉන්වෙන්ට්‍රි තොරතුර සහ පීසා ඇණවුම මුලුතැන්ගෙයි සූපවේදියා වෙත ලබා දෙන අතර ඔහු විසින් ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීම සඳහා ඉන්වෙන්ට්‍රියෙන් භාවිත කරන ලද අමු ද්‍රව්‍ය තොරතුරු දුරකථන ක්‍රියාකරු වෙත ලබා දී ඇණවුමට අදාලව සකසන ලද පීසා, මුදල් අයකැමි වෙත ලබා දෙයි. මුදල් අයකැමි විසින් ඇණවුම් ලේඛනය පිරික්සා ඇණවුම් තොරතුරු ලබාගෙන බිල්පත පාරිභෝගිකයා වෙත ලබා දෙයි. පාරිභෝගිකයා මුදල් සහ බිල්පත ලබාදුන් පසු මුදල් ගෙවූ බවට මුද්‍රා තබා බිල්පත හා ඉතිරි මුදල නැවත පාරිභෝගිකයාට ලබා දෙයි. ඇණවුම්වලට අදාල සකසන ලද පීසා ලැබුණු පසුව බිල්පත මුදල් අයකැමි විසින් නැවත ලබාගෙන පරීක්ෂා කර බිල්පත සහ පීසා ලබා දෙයි. මුදල් අයකැමි විසින් විකුණුම් තොරතුරු ලේඛනය යාවත්කාලීන කරයි. ශාඛා කළමනාකරු විසින් මුදල් අයකැමිගෙන් විකුණුම් වාර්තාවක් ඉල්ලූ විට මුදල් අයකැමි විසින් ඉන්වෙන්ට්‍රි තොරතුරු, විකුණුම් තොරතුරු සහ ඇණවුම් තොරතුරු ගොනු තුලින් ලබාගෙන විකුණුම් වාර්තාවක් සකස් කර ලබාදෙයි.

(a) ඉහත ක්‍රියාකාරකම් නිරූපණය සඳහා අඳිනු ලැබූ සන්දර්භ සටහන පහත දැක්වේ. එහි ① සිට ⑩ තෙක් ස්ථානවලට අදාළ දත්ත ගැලීම් විස්තරයන් හඳුනාගෙන ලියා දක්වන්න.






(8) WWW.PastPapers.WiKi (7)

Download Term Test Papers, Short Notes From One Place!

(b) ඉහත සන්දර්භ සටහන සඳහා පළමු මට්ටමේ දත්ත ගැලීම් සටහනක් පහත පෙන්වා ඇත. එහි Ⓐ සිට Ⓗ තෙක් ස්ථානවලට අදාළ දත්ත ගැලීම් විස්තරයන් සහ දත්ත ගබඩා හඳුනාගෙන ලියා දක්වන්න. (මෙහි ඇතැම් දත්ත ගබඩා අනුපිටපත් වී ඇත.)




(c) *Pizza planet* වෙළඳසල සඳහා මාර්ගගත පීසා ඇණවුම් පද්ධතියක් තිබීම තුළින් එහි අලෙවිය වැඩි කර ගැනීමට හැකි බව ශාඛා කළමනාකරු පවසයි. ඒ සඳහා වාණිජ පෙරනිමි මෘදුකාංග පැකේජයක් සුදුසු යැයි මුදල් අයකැමි යෝජනා කරනු ලැබුව ද ශාඛා කළමනාකරු විසින් සම්මත ව්‍යාපාරික යෙදවුම් මෘදුකාංගයක් සුදුසු යැයි තීරණය කරයි. මෙම මෘදුකාංග පැකේජ දෙක සංසන්දනය මගින් ශාඛා කළමනාකරුගේ මෙම තීරණය සඳහා පාදක විය හැකි හේතු දෙකක් පැහැදිලි කරන්න.

(d) ඉහත යෝජිත මාර්ගගත පීසා ඇණවුම් පද්ධතියක තිබිය යුතු ඇතැම් කාර්යබද්ධ, කාර්යබද්ධ නොවන සහ වෙනත් අවශ්‍යතා ලැයිස්තුවක් පහත දැක්වේ. මෙම අවශ්‍යතා අතුරින් කාර්යබද්ධ අවශ්‍යතා හඳුනාගෙන ඒවායේ ලේබල ලියා දක්වන්න.

A - පද්ධතියේ පරිශීලක මිත්‍රශීලී අතුරු මුහුණතක් තිබිය යුතුය.
B - පද්ධතිය ඕනෑම වෙබ් අතරික්සුවක ක්‍රියා කළ යුතුය.
C - පීසා වර්ග, එහි ප්‍රමාණය සහ මුදල බලා ගැනීමට පරිශීලකයින්ට අවස්ථාව ලබාදිය යුතුය.
D - සෑම නව ලියාපදිංචි වීමකදීම පළමු ඇණවුම සඳහා 10% ක වට්ටමක් ලබා දිය යුතුය.
E - පද්ධතිය විසින් දුරකථන අංකය සහ මුරපදය මගින් පරිශීලක අනන්‍යතාවය තහවුරු කළ යුතුය.
F - පද්ධතිය බිඳ වැටීමකදී පාරිභෝගික තොරතුරු ආරක්ෂා විය යුතුය.
G - පද්ධතිය අනවසර ප්‍රවේශයන්ගෙන් වලක්වා ගත යුතුය.


Download Term Test Papers, Short Notes From One Place!

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

20 S I

# තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023

## තොරතුරු සන්නිවේදන තාක්ෂණය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| Question | Answer | Question | Answer | Question | Answer | Question | Answer | Question | Answer |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 4 | 11 | 2 | 21 | 5 | 31 | 4 | 41 | 1 |
| 2 | 3 | 12 | 3 | 22 | 1 | 32 | 4 | 42 | 2 |
| 3 | 2 | 13 | 5 | 23 | 5 | 33 | 3 | 43 | 3 |
| 4 | 4 | 14 | 4 | 24 | 4 | 34 | 5 | 44 | 1 |
| 5 | 2 | 15 | 4 | 25 | 3 | 35 | 1 | 45 | 3 |
| 6 | 3 | 16 | 3 | 26 | 1 | 36 | 5 | 46 | 4 |
| 7 | 1 | 17 | 3 | 27 | 3 | 37 | 4 | 47 | 1 |
| 8 | 2 | 18 | 1 | 28 | 2 | 38 | 4 | 48 | 5 |
| 9 | 1 | 19 | 4 | 29 | 4 | 39 | 3 | 49 | 4 |
| 10 | 4 | 20 | 4 | 30 | 5 | 40 | 5 | 50 | 1 |

### II පත්‍රය - A කොටස

**1 a** (ලකුණු 02 යි)




**b** (ලකුණු 02 යි)

```
<html> <head>
</head> <body>
<h1 style= "font-family: arial; text-align:center;" >Cascading style sheets </h1>   ← ලකුණු 1
<p style= "font-family: arial; text-align: center; color:blue;"><u>Cascading style sheets,</u>
<br>fondly referred to as CSS is a simple design Language intended to simplify the process of
 making web pages presentable </p>  ← ලකුණු 1
</body> </html>
```

**c** — ලකුණු 04 යි

```html
<html><head> <title> registration Form</title> </head>
<body>
<h2> ICT club Registration Form </h2>
<form action='display.php' method='post'>
<div>Name <input type = 'text' name= 'name'>     } ලකුණු 0.5
Class <input type = 'text' name= 'class'>        }
</div><br>
<p><div>
<h2> select your gender</h2>
<input type='radio' name='gender' value='male'/> Male        } ලකුණු 0.5
<input type='radio' name='gender' value='female'/>Female     }
</div><br>
<div>
<b> select your Grade Category  </b>
<select name= 'Grade'>
<option value='Grade 6-9' selected >Grade 6-9</option>         }
<option value='Grade 10-11'>Grade 10-11</option>               } ලකුණු 1
<option value='Grade 12-13'>Grade 12-13</option>               }
</select>                                                      }
</div><br>
<div style="width:450px;">
<fieldset>
<legend> Select your faviort Categories  </legend>   <-- ලකුණු 1

<input type='checkbox' name='Catogary1' value='Graphic'/>Graphic <br>              }
<input type='checkbox' name='Catogary2' value='Programming'/>Programming <br>      } ලකුණු 1
<input type='checkbox' name='Catogary3' value='Web'/> Web  <br>                    }
</fieldset></div>
<br>
<input type='submit' name='submit' value='submit'/>
</form></body></html>
```

**d** — ලකුණු 02 යි

```php
<?php
if ($_SERVER['REQUEST_METHOD']=="POST")
{
 $name= $_POST['name'];              }
 $class= $_POST['class'];            } ලකුණු 1
 $Grade= $_POST['Grade'];            }
 $Gender=$_POST['gender'];   }       }

echo "<h2> Your details: </h2>";     }
echo 'name:-', $name, "<br>";        }
echo 'Class:-', $class, "<br>";      } ලකුණු 1
echo 'Gender:-', $Gender, "<br>";    }
echo 'Grade:-', $Grade, "<br>";      }
?>
```

| | | | |
|---|---|---|---|
| 2 | a | 1 සෝෂාව 2. සමානුපාතික පිරික්සුම 3. දොරටුමග 4.විකෘතිය | ලකුණු 4 යි (1×4) |
| | b | (i) *ප්‍රති වෙන්දේසිය*<br>(ii) *කණ්ඩායම් ලෙස මිලදී ගැනීම*<br>(iii) *මාර්ගගත වෙළඳ සංවිධාන*<br>(iv) *ක්ෂුද්‍ර ණය ගෙවීම්*(Bit Coin) | ලකුණු 4 යි (1×4) |
| | c | A. වැරදි B. නිවැරදි C. නිවැරදි D. නිවැරදි | ලකුණු 2 යි (0.5×4) |

<table>
<tr><td>3</td><td>a</td><td>Ⓐ - සූදානම්/රැඳී සිටින<br>Ⓑ - ධාවන<br>Ⓒ - අවහිර කළ<br>Ⓓ - ප්‍රතිහරණය කළ සහ අවහිර කළ<br>Ⓔ - ප්‍රතිහරණය කළ සහ රැඳී සිටින</td><td>ලකුණු 2.5 යි<br>(0.5×5)</td></tr>
<tr><td></td><td>b</td><td>Ⓐ සිට Ⓑ - කෙටි කාලීන නියමකරණය<br>Ⓒ සිට Ⓓ - මධ්‍යකාලීන නියමකරණය<br>නිර්මිත(නව) සිට Ⓐ - දිගු කාලීන නියමකරණය</td><td>ලකුණු 3 යි<br>(1×3)</td></tr>
<tr><td></td><td>c</td><td>බිටු 24 මගින් සෑදිය හැකි ලිපින ගණන $= 2^{24}$ ⟵ ලකුණු 1<br>එක් ලිපිනයකින් නිරූපණය වන ප්‍රමාණය $= 2\ byte$<br>මතකයේ විශාලත්වය $= 2^{24} \times 2\ byte$ ⟵ ලකුණු 1<br>$= 2^{25}\ byte$<br>$= 32\ MB$ ⟵ ලකුණු 1</td><td>ලකුණු 3 යි</td></tr>
<tr><td></td><td>d</td><td>$FAT$ තුළ ගොනුව පවතින කාණ්ඩ වල නාමාවලි සියල්ල ම ඇති බැවින් එමගින් ගොනුව වෙත ප්‍රවේශ විය හැක. ⟵ ලකුණු 0.5<br>එබැවින් එක් කාණ්ඩයක දෝෂයක් හට ගැනුන ද ඊ ළග කාණ්ඩ වෙත යාමට අවශ්‍ය නාමාවලි $FAT$ මගින් ලබා ගත හැකිය. ⟵ ලකුණු 1</td><td>ලකුණු 1.5 යි</td></tr>
<tr><td>4</td><td>a</td><td>
</td><td>ලකුණු 04 යි<br>(1×4)</td></tr>
<tr><td></td><td>b</td><td>num=int(input("Enter the number to be multiplied : "))<br>for i in range (1,11):<br>   print(num*i)</td><td>ලකුණු 04 යි<br>(1×4)</td></tr>
<tr><td></td><td>c</td><td>0 1 1 2 3</td><td>ලකුණු 01 යි</td></tr>
<tr><td></td><td>d</td><td>(i) I am learning Python<br>(ii) f=open('ABC.txt','a') ⟶ f=open('ABC.txt','w')</td><td>ලකුණු 01යි<br>(0.5 ×2)</td></tr>
</table>

II පත්‍රය - B කොටස

**5 a**

$(A+B+C)(A+B+\bar{C})(A+\bar{B}+C)(\bar{A}+B+C)(\bar{A}+\bar{B}+\bar{C})$

ලකුණු 2 යි

**b i**




ලකුණු 3 යි

**ii**

| A | B | C | P | Q | R |
|---|---|---|---|---|---|
| 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 0 | 0 | 1 | 1 | 1 | 1 |
| 0 | 1 | 0 | 1 | 1 | 0 |
| 0 | 1 | 1 | 0 | 1 | 1 |
| 1 | 0 | 0 | 1 | 1 | 0 |
| 1 | 0 | 1 | 0 | 0 | 0 |
| 1 | 1 | 0 | 0 | 1 | 0 |
| 1 | 1 | 1 | 1 | 1 | 1 |

ආදාන නිවැරදිව දැක්වීම - 1 Mark
P හා Q ප්‍රතිදාන නිවැරදිව දැක්වීම - 1 Mark
R ප්‍රතිදානය නිවැරදිව දැක්වීම - 1 Mark

ලකුණු 3 යි

**iii**

$\bar{A}\bar{B}C+\bar{A}BC+ABC$

ලකුණු 2 යි

**iv**




$\boldsymbol{A\bar{C}+BC}$

නිවැරදි කාණ්ඩ කිරීම - 1 Mark
නිවැරදි බූලීය ප්‍රකාශනයක් ලබා ගැනීම- 1 Mark

ලකුණු 2 යි

**v**




ලකුණු 3 යි

**6 a**

(1) 7ක් (2) භෞතික (3) දත්ත සැබැදි (4) ප්‍රවාහන
(5) සැසි (6) සමර්පන

ලකුණු 3 යි
(0.5 ×6)

**b i**

පළමු යොමුව 192.200.1.0 ← ලකුණු 0.5
අවසාන යොමුව 192. 200. 1.127 ← ලකුණු 0.5

ලකුණු 1 යි

| | | | | |
|---|---|---|---|---|
| | | ii | 255.255.255.128 | ලකුණු 1 යි |
| | | iii | බිටු 3 කි | ලකුණු 1 යි |
| | | iv | | ලකුණු 4 යි<br>(එක් පේළියකට ලකුණු 1) |

| උපජාල අංකය (subnet Number) | ජාල යොමුව (Network Address) | උපජාල ආවරණය (Subnet mask) | භාවිතා කළ හැකි පළමු යොමුව (First host address) | භාවිතා කළ හැකි අවසන්යොමුව (Last host address) | විකාශන ලිපිනය (Broadcast address) |
|---|---|---|---|---|---|
| D001 | **192.200.1.64** | **255.255.255.224** | **192.200.1.65** | **192.200.1.94** | 192.200.1.95 |
| D002 | 192.200.1.0 | **255.255.255.192** | **192.200.1.1** | **192.200.1.62** | **192.200.1.63** |
| D003 | **192.200.1.96** | **255.255.255.240** | 192.200.1.97 | **192.200.1.110** | **192.200.1.111** |
| D004 | **192.200.1.112** | **255.255.255.240** | **192.200.1.113** | **192.200.1.126** | **192.200.1.127** |

| | | | | |
|---|---|---|---|---|
| | c | i | සමමිතික යතුරුකේතන ක්‍රමය හා අසමමිතික යතුරුකේතන ක්‍රමය ගුප්ත කේතන ක්‍රමවේදයක් වන අතර කේතනයේදී හා විකේතනයේදී එක් මෘදුකාංග යතුරක් භාවිතා වන අතර අසමමිතික යතුරුකේතන ක්‍රමයේදී කේතනය සහ විකේතනය සඳහා එකිනෙකට වෙනස් මෘදුකාංග යතුරු දෙකක් භාවිත වේ. | ලකුණු 1 යි |
| | | ii | • වෛරස - අනවසරයෙන් පරිගණක පද්ධතියට ඇතුළුවී ස්වයංක්‍රීයව ස්ථාපනය වී හානිකර කාර්යයන් සිදු කරයි.<br>• ට්‍රෝජන් - පරිශීලකයන් නොමග යවමින් පරිගණකය ආක්‍රමනය කරන හානිකර පරිගනක වැඩසටහනකි.<br>**වෙනත් ගැලපෙන පිලිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.** | ලකුණු 1 යි |
| | d | i | (1) නියෝජන සේවාදායකය යනු අන්තර්ජාලය සහ පරිශීලක පරිගනකය අතර අතරමැදියකු ලෙස ක්‍රියා කරන ක්‍රියාකරන පරිගණකයකි.<br>(2) විශාල ආයතනයක් අන්තර්ජාලය වෙත සම්බන්ධ වීමේදී ඇතිවන ලිපි යොමු දෝෂ වලට නියෝජන සේවාදායකය විසඳුම් සපයයි.<br>(3) නියෝජන සේවාදායකය මගින් අභ්‍යන්තර ජාලයක ආරක්ෂාව වැඩිදියුණු කරයි.<br>(4) අභ්‍යන්තර ජාලය මගින් අන්තර්ජාල ප්‍රවේශ වීම සීමා කිරීම සිදු කරයි . | ලකුණු 2 යි |
| | | ii | වසම් නාමය IP ලිපිනයකට ගැලපීම සිදුකරයි. | ලකුණු 1යි |
| 7 | a | i | 1 - C (ධාරා පාලක මොඩියුලය)<br>2 - A (සන්නිවේදන මොඩියුලයක් සහිත ක්ෂුද්‍ර පාලකය)<br>3 - S (සංවේදකය) | ලකුණු 0.5 x3<br>= 1.5 යි |
| | | ii | සංවේදකය යනු ආදාන උපක්‍රමයක් පමණක් වන නිසාය. | ලකුණු 1 යි |
| | | iii | ආලෝක Sensor(සංවේදකය) | ලකුණු 1 යි |
| | b | | X - O_L>=64<br>Y - O_L<=1023<br>P - O_L>=0<br>Q - O_L<=63<br>R - ධාරා පාලකය ක්‍රියාත්මකව නැත<br>(equal sign = is not mandatory for comparisons) | ලකුණු 2.5 යි<br>(0.5×5) |
| | c | | Motion-PIR | ලකුණු 1 යි |
| | d | i | ඒජන්ත1 හා සෙවුම් ඒජන්ත | ලකුණු 0.5x 2 = 1 යි |
| | | ii | • පරිශීලක/මිනිස් මැදිහත්වීමක් නොමැතිව සමූහ ක්‍රියාකාරිත්වයක් මගින් නිවෙස් ආරක්ෂණය<br>• තත්ව කාලීනව කෘතීම බුද්ධි පද්ධතියක් මගින් ආරක්ෂණය සම්බන්ධව තීරණ ගැනීම<br>• සමායෝජිත ක්‍රියාකාරිත්වයක් මගින් පරිසර තත්ව කිහිපයක් අධීක්ෂණය<br>• කාර්යක්ෂමව බලශක්ති පාරිභෝජනය මගින් පරිසර තත්ව පාලනය<br>• නිවෙස් ආරක්ෂණය සම්බන්ධව යෝග්‍යම තීරණ ස්වයංක්‍රීයව ලබා ගැනීම, අවශ්‍යම අවස්ථාවල පමණක් මිනිස් සහභාගිත්වය තහවුරු කර ගැනීම. | ලකුණු 1x 2 = 2 යි |
| | | iii | • හදිසි තත්වයක් සඳහා තත්‍ය කාලීනව ප්‍රතිචාර ලබා දිය නොහැකි වීම/ ප්‍රතිචාර ලබා දීමට ප්‍රමාද වීම<br>• නිවසේ අනාරක්ෂිත තත්වයන් පිළිබඳ අන්තර්ජාලයේ සෝදිසි කිරීමේ දී වෙනත් අනාරක්ෂිත තත්වයන් නිර්මාණය විය හැකි වීම | ලකුණු 1 යි |

**e i** Subscription as a Revenue Model - ග්‍රාහකත්වය ආදායම් ආකෘතියක් ලෙස — ලකුණු 1 යි

**ii** — ලකුණු 2 යි

- පද්ධතියට ලැබෙන ඉල්ලීම් සහ සංවේදක දත්ත ඉහළ යාම නිසා ක්‍රියාකාරිත්වයෙහි මන්දගාමී බවක් ඇතිවිය හැකි වීම.
- ජාලගත සම්බන්ධතාවයන් පුළුල් කිරීමට සිදුවීම නිසා අමතර පිරිවැයක් දරමින් පද්ධතිය නඩත්තු කිරීමට සිදු වීම
- පද්දතියට ප්‍රවේශ වන පරිශීලකයින් සංඛ්‍යාව ඉහළ යාම නිසා පද්ධතියේ දත්ත වල ආරක්ෂිත බවට තර්ජන මතු විය හැකි වීම

**iii** — ලකුණු 1 යි

- හුවමාරු වන දත්ත සඳහා ගුප්ත කේතනය ක්‍රියාත්මක කළ යුතු ද යන්න ඒජන්තවරයෙකු හරහා පරීක්ෂා කර බලා එසේ අවශ්‍යතාවයක් පවතීනම් එම දත්ත සුදුසු ගුප්ත කේතන ක්‍රමයන්ට යටත් කිරීම
- ජාලයට යොමුවන අනවශ්‍ය දත්ත හෝ ඉල්ලීම් හා අනවසර ප්‍රවේශන ඉල්ලීම් පරීක්ෂා කිරීමට හා වැළැක්වීමට ආරක්ෂක ඒජන්තවරයෙකු පත් කිරීම

**8 a i** 7 — ලකුණු 02 යි

**ii** output = str(B) + str(A) — ලකුණු 02 යි

**b** — ලකුණු 05 යි

**විකල්ප පිළිතුරු - 1**

```
addnum=input("Enter the Admission number : ")
length=len(addnum)
num=" "
for i in range (length):
   if addnum[i]>='0' and addnum[i]<='9':
      num=num+addnum[i]
if (int(num)%2)= =0:
   print("Olu")
else:
   print("Nelum")
```

**විකල්ප පිළිතුරු - 2**

```
addnum=input("Enter the Admission number : ")
length=len(addnum)
num=" "
for i in range (length):
   if addnum[i].isdigit():
      num=num+addnum[i]
if (int(num)%2)= =0:
   print("Olu")
else:
   print("Nelum")
```

සැ.යු. ඃ ඉහත දැක්වෙන පිළිතුරු දෙකට අමතරව නිවැරදි ඕනෑම පයිතන් ක්‍රමලේඛයකට ලකුණු ලබාදෙන්න.

**c** — ලකුණු 06 යි




A,G - (ලකුණු 0.5 X 02 = 1)
B,C,D,E,F - (ලකුණු 1 X 5 = 5)

මෙම පිළිතුරෙහි ඇති sum,count ,num විචල්‍ය හැර සිසුන් භාවිත කර ඇති නිවැරදි විචල්‍ය සමග නිවැරදි ඇල්ගොරිතමයට ලකුණු ලබාදෙන්න.

(7) WWW.PastPapers.WiKi (6)
Download Term Test Papers, Short Notes From One Place!

<table>
<tr><td>9</td><td>a</td><td></td><td>

A – Supplier/Item භූථාර්ත නිවැරදි සංකේත සහිතව දැක්වීම (ලකුණු 2 යි).<br>B - සම්බන්ධතාව නිවැරදි ගණනීයතාව සමඟ දැක්වීම (ලකුණු 2යි)/ සම්බන්ධතාවයේ උපලක්ෂණය දක්වා නොමැතිනම් ලකුණු 1ක් අඩු කරන්න.<br>C - භූතාර්ත දෙකෙහි නිවැරදි උපලක්ෂන සඳහා (ලකුණු 2යි)/බහු අගයන් සහිත උපලක්ෂණය අදාළ නොවේ.<br>D - බහුඅගයන් සහිත උපලක්ෂණය සඳහා (ලකුණු 1යි)</td><td>ලකුණු 7 යි</td></tr>
<tr><td></td><td>b</td><td>i</td><td>පළමු ප්‍රමතකරණයේ පවතී/1NF ) ආංශික පරායත්තතාවක් පවතී (Partial dependency) student_mark වගුවෙහි ප්‍රාථමික යතුරෙහි කොටසක්වන subject_code මත එම වගුවෙහිම යතුරු නොවන ක්ෂේත්‍රයක්වන subject_name පරායත්ත වේ</td><td>ලකුණු 3යි</td></tr>
<tr><td></td><td></td><td>ii</td><td>Student_mark(st_id,subject_code,marks)<br>Subject(subject_code,subject_name)</td><td>ලකුණු 2 යි</td></tr>
<tr><td></td><td></td><td>iii</td><td>A - SELECT distinct(subject_name) FROM subject;</td><td>ලකුණු 1 යි</td></tr>
<tr><td></td><td></td><td></td><td>B - SELECT * FROM subject WHERE subject_name LIKE ‘%formation%’;</td><td>ලකුණු 1 යි</td></tr>
<tr><td></td><td></td><td></td><td>C -<table><tr><th>St_id</th><th>Subject_code</th><th>marks</th></tr><tr><td>S78452</td><td>ICT20</td><td>84</td></tr><tr><td>S78569</td><td>ICT20</td><td>90</td></tr></table></td><td>ලකුණු 1 යි</td></tr>
<tr><td>10</td><td>a</td><td></td><td>(1) - දුරකථන අංකය<br>(2) - නව පාරිභෝගික තොරතුරු<br>(3) - ඇණවුම<br>(4) - බිල්පත<br>(5) - මුද්‍රා තැබූ බිල්පත + මුදල<br>(6) - මුද්‍රා තැබූ බිල්පත + පීසා<br>(7) - ඇණවුම<br>(8) - ඉන්වෙන්ට්‍රි තොරතුරු<br>(9) - පීසා<br>(10) - විකුණුම් වාර්තාව</td><td>ලකුණු 5 යි<br>(0.5×10)</td></tr>
<tr><td></td><td>b</td><td></td><td>(A) - පැරණි පාරිභෝගික තොරතුරු<br>(B) - නව පාරිභෝගික තොරතුරු<br>(C) - වට්ටෝරු/ වට්ටෝරු තොරතුරු<br>(D) - මුදල් අයකැමි<br>(E) - ඇණවුම්<br>(F) - විකුණුම් තොරතුරු<br>(G) - ඉන්වෙන්ට්‍රිය<br>(H) - විකුණුම් තොරතුරු</td><td>ලකුණු 4 යි<br>(0.5×8)</td></tr>
<tr><td></td><td>c</td><td></td><td><table><tr><th>වාණිජ පෙරනිමි පැකේජ</th><th>සම්මත ව්‍යාපාරික යෙදවුම්</th></tr><tr><td>මෘදුකාංගය සැලසුම් කර ඇති ආකාරය ආයතන ක්‍රියාවලියට වඩා වෙනස් විය හැකිය</td><td>ආයතන ක්‍රියාවලියට බොහෝ සෙයින් ගැලපෙන ආකාරයට සකස් කළ හැකිය</td></tr><tr><td>පරිශීලකයාට අවශ්‍ය නොවන බොහෝ විශේෂාංග අඩංගු විය හැකිය</td><td>පරශීලකයා හට අවශ්‍ය නොකරන විශේෂාංග ඇතුලත් නොවේ</td></tr><tr><td>මෘදුකාංගය සංකීර්ණ වේ.</td><td>මෘදුකාංගයේ සංකීර්ණ බව අඩුය.</td></tr><tr><td>අනෙක් තරගකාරී ආයතනයන් තුලද මෙම මෘදුකාංගයම තිබිය හැකිය</td><td>ආයතනයටම පමණක් සුවිශේෂී වීම නිසා</td></tr></table>සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න. මෘදුකාංග වර්ග 2 සංසන්දනය කළ යුතුවේ.</td><td>ලකුණු 4 යි</td></tr>
<tr><td></td><td>d</td><td></td><td>C, E<br>මීට අමතරව වෙනත් පිළිතුරු ඇත්නම් ලකුණු නොමැත.</td><td>ලකුණු 2</td></tr>
</table>

PAST PAPERS WIKI



Download Term Test Papers, Short Notes From One Place!

LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න